සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

පිළිතුරු පත්‍රය
Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 11
විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය
පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## ක්‍රිස්තියානි ධර්මය I

| | | | |
|---|---|---|---|
| (1) ii | (11) i | (21) ii | (31) i |
| (2) iv | (12) iv | (22) i | (32) iii |
| (3) iii | (13) i | (23) iii | (33) i |
| (4) iv | (14) ii | (24) iv | (34) iv |
| (5) iv | (15) iii | (25) iv | (35) ii |
| (6) i | (16) iv | (26) i | (36) i |
| (7) iv | (17) ii | (27) iii | (37) i |
| (8) ii | (18) iii | (28) ii | (38) iii |
| (9) i | (19) iv | (29) iv | (39) iv |
| (10) iii | (20) iv | (30) ii | (40) ii |

(ලකුණු 1×40 = 40)

## ක්‍රිස්තියානි ධර්මය II

(01) (i) ගව ඔරුවක බාවා සිටින බිළිඳෙකි (ල. 2)

(ii) (අ) ඔබේ පියාටද, මවටද ගෞරව කරන්න (ල. 1)

(ආ) එය පොරොන්දුවක් ඇති එකම ආඥාව වීම නිසාය (ල. 2)

(iii) ★ දේව කැඳවීමට කීකරු වෙමින් යහපත් ප්‍රතිචාර දැක්විය යුතු බව

★ ජේසුස්වහන්සේගේ ශුද්ධත්වය හා දේවත්වය තුළ අප ජීවිතවල පාපී ස්වභාවය වටහා ගත යුතු බව. (මීට සමාන පිළිතුරු සඳහා) (ල. 2)

(iv) (අ) A ජේසුස් වහන්සේ B කිතුනු අප (ල. 1)

(ආ) නියම කිතුනුවෙකු ලෙස දිවි ගෙවමින් ඵල දැරීම සඳහා ජේසුස්වහන්සේට ඒකාබද්ධ වියයුතු බවය. (ල. 1)

(v) (අ) නිහතමානී වීමේ අභියෝගය

(ආ) දේවමාළිගය යාච්ඤාවේ හා ධර්මිෂ්ඨකමේ ස්ථානයක් කිරීමේ අභියෝගය (ල. 2)

(vi) (අ) ස්ථානෝචිත ප්‍රඥාව (ආ) නොපසුබට වීර්යය (ල. 2)

(vii) (අ) පුනරුත්ථානය වූ ජේසුස්වහන්සේ විසින් ශ්‍රාවකයන්ට (ල. 1)

(ආ) ජේසුස්වහන්සේ මරණින් උත්ථාන වී ඇති බවය (ල. 1)

(viii) (අ) මාරුත දමනය, පනස්දහසකට කෑම දීම (ල. 1)

(ආ) ඇඳහිල්ල (ල. 1)

(ix) (අ) මානෙල් මල්, පක්ෂීන් (ල. 1)

(ආ) පළමුකොට දෙවියන් වහන්සේගේ රාජ්‍යය සෙවීම (ල. 1)

(x) (අ) ආත්මයාණන්වහන්සේ (ආ) මාංශික තෘෂ්ණා (ල. 2)

(ලකුණු 2x10=20)

(02) (i) ධර්මදූතයන් 70 දෙනා යැවීම (ල. 2)

(ii)
- ★ සේවකයන් ඉල්ලා යාච්ඤා කිරීම
- ★ නිවෙස් වල සාමය පැතීම
- ★ රෝගීන් සුව කිරීම
- ★ දෙවියන්වහන්සේගේ රාජ්‍යය පැමිණ තිබෙන බව දැන්වීම (මින් 03කට ල. 03යි)

(iii)
- ★ සුබ අස්න ප්‍රමාද නොවී ප්‍රකාශ කිරීම
- ★ ධර්මදූත සේවයේ අභියෝග හා පීඩා වලට දිරියෙන් මුහුණ දීම
- ★ චාම් දිවි පෙවෙතක් ගත කිරීම
- ★ දෙවියන්වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසයෙන් රැඳීම
- ★ ධර්මදූත සේවයේදී නොකඩවා යාච්ඤාවෙන් සවිය පැතීම

(මෙවැනි කරුණු 05 කට ල.05යි)

(03) (i) පෙන්තකොස්ත දින (ල. 2)

(ii)
- ★ සැඩ සුළඟක් හමන්නාක් වැනි ශබ්දයක් ඇසීම
- ★ ගිණි වැනි දිවි බෙදී ගොස් ශ්‍රාවකයන් මත පිහිටීම
- ★ සියල්ලෝ අන්‍ය භාෂා වලින් කතා කිරීම (ල.3)

(iii)
- ★ නිරතුරුවම යාච්ඤාවෙන් දේව මඟපෙන්වීම ලබා ගැනීම
- ★ ශුද්ධාත්ම බලය තුල නිවැරදි තීරණ ගැනීම
- ★ සාකච්ඡාවෙන් විසඳුම් සෙවීම
- ★ දේව වචනයට සෑම විටම මුල්තැන දීම
- ★ සමානාත්මතාවය උසස් කොට සැලකීම
- ★ දෙවියන් වහන්සේ ලබාදී ඇති විවිධ හැකියාවන් සභාවේ අභිවෘද්ධිය සඳහා යෙදවීම

(මෙවැනි කරුණු 05 කට ල.05යි)

(04) (i) ශුද්ධ වූ දේවමාළිගාවේ සිටියදීය (ල.2)

(ii) උස් වූ උදාරවූ සිංහාසනයක දෙවියන් වහන්සේ වැඩසිටින අතර, උන්වහන්සේගේ සුවිශුද්ධකම පිළිබඳව උන්වහන්සේ වටා සිටින සෙරාප්වරුන් තෙවරක්ම හඬ නගා කියති. යෙසායා තමා කාලකණ්නියෙකු බවත්, අපවිත්‍ර තොල් ඇති මිනිසෙකු බවත් කියූ අතර සෙරාප්වරුන්ගෙන් කෙනෙක් ගිණි අඟුරක් ගෙන ඔහුගේ මුඛයේ තවරමින් ඔහු පිරිසිදු කරයි. (ල.3)

(iii) දෙවියන්වහන්සේ අශුද්ධ පාපී මිනිසා ප්‍රතික්ෂේප නොකර පිළිගන්නා සේක. මෙසේ දෙවියන් වහන්සේ ඉදිරියේ පිළිගැනීමක් ලබන මිනිසා කමාව ලබනවා පමණක් නොව ඊටත් වඩා වැඩියමක් දෙවියන් වහන්සේ වෙතින් ලබයි. එසේ වන්නේ ඔහු තමාගේ පාප පිළිබඳව සැබෑ පසුතැවීමකින් පැමිණි විටයි. එවිට දෙවියන්වහන්සේ විසින් සුවිශුද්ධ ජීවිතයක් ඔහු ලබයි. (ල.5)

(05) (i) ජේසුස්වහන්සේගේ නැවත පැමිණීමයි. (ල.2)

(ii) එම කෙටි රූපකය මගින් ජේසුස්වහන්සේ ඉදිරිපත් කළේ දේව රාජ්‍යයේ පුරවැසියන් උන් වහන්සේ නැවත වඩින මොහොත වන තෙක් ඉවසිල්ලෙන් හා සූදානමින් බලා සිටිය යුතු බවයි. එහිදී උන්වහන්සේගේ දේව රාජ්‍යයේ සේවයෙහි නිරතව සිටීම අපේක්ෂා කෙරේ.

(ල.3)

(iii) ★ නිරතුරුව සූදානමින් සිටීම
★ විශ්වාසදායක හා වගකීමෙන් යුතු සේවයක නිරත වීම
★ සැබෑ ලෙස අවංකව මනස්ථාපනය වීම
★ නිරතුරුවම ජේසුස්වහන්සේ සමග ගැඹුරු සබඳතාවයකට ඇතුලත් වීම
★ දේව කැමැත්ත හා දේව වචනය අනුව ජීවිතය ගොඩනගා ගැනීම

(මේවා විස්තර කල යුතුය ල.05යි)

(ලකුණු 10 යි)

(06) (i) ★ රෝම පුරවැසිභාවය ලැබීම
★ පරිසිවරයෙකු ලෙස අත්දැකීම් ලැබීම
★ කූඩාරම් කර්මාන්තයේ යෙදීම
★ භාෂා කීපයක් ඉගෙනීම (මින් 02කට ල. 02 යි)

(ii) ★ ඇස් නොපෙනී සිටීම
★ නොකා නොබී සිටීම
★ ජේසුස්වහන්සේගේ හඬ ඇසීම (ල. 3)

(iii) ★ යාච්ඤාව තුලින් ජීවිතයට මුහුණ දීම
★ සැමවිටම දේව තීරණ ක්‍රියාත්මක වීමට ඉඩ හැරීම
★ නිරතුරුවම ශුද්ධාත්ම බලය තුළ ක්‍රියාත්මක වීම
★ නොපසුබට වීර්යයෙන් සේවයේ යෙදීම
★ සේවයේ අභියෝග වලට දේව ශක්තිය තුළ මුහුණ දීම (ල.5)

(ලකුණු 10 යි)

(07) (i) ★ පිලිප්පියේ පාවුල්තුමාගේ සේවය
★ ගං ඉවුරේදී ලිදියා හමුවීම හා ඈ තුළින් ස්ත්‍රී මූලික සමාජයක් බිහිවීම
★ ගුප්ත ආත්මයන් ආවේශ වූ ස්ත්‍රියකගේ ආත්මය දුරු කිරීම
★ සිරගතවීමේ දඬුවමට ලක්වීම
★ පොළොකම්පාව හා සිරගෙයි මුලාදෑනියා ඇතුළු පවුල ගැලවීම ලැබීම
★ නොපසුබට වීර්යය තුළින් අභියෝග ජය ගැනීම (ල.5)

(ii) ★ ජේසුස්වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය
★ පාස්කු මංගල්‍යය සිහිකිරීම සඳහා ජේසුස්වහන්සේ හා ශ්‍රාවකයන් එක්රැස් වීම
★ සහෝදරත්වය, සහභාගීත්වය පිළිබිඹු කරමින් රොටී කැඩීමේ පිළිවෙත සිදු කිරීම
★ ජේසුස්වහන්සේගේ මංශ හා රුධිරය සඳහා සංකේත ලෙස රොටී හා මිදියුෂ ඉදිරිපත් කිරීම
★ පාපයේ මිළ ගෙවන බැටළු පෝතකයාණන් මගින් ගැළවීම අත්කරදීමේ කර්තව්‍යය මෙහිදී සනාථ කිරීම
★ ශු. සහභාගීකම ස්ථාපිත කරමින් දේවරාජ්‍යයේ මෙහෙවර තුළ දුක් විඳීමේ පංගුකාරකමට අප පත් කිරීම (ල.5)

(iii) කිතුනුවා තුළ තිබිය යුතු ජීවිත ප්‍රතිපත්ති
★ කිතුනුවාගේ ජීවිතය ස්වාමින් වහන්සේට ප්‍රසන්න පූජා යාගයක් විය යුතු බව
★ ස්වාමින්වහන්සේ අපට කමා කළාක් මෙන් අපද අන් අයට කමා කළයුතු බව

- ★ අප වචනයෙන් හෝ ක්‍රියාවෙන් කුමක් කරතත් ඒ සියල්ල ස්වාමින්වහන්සේගේ නාමයෙන් කරමින් දෙවියන්වහන්සේට ස්තුති කළයුතු බව.
- ★ සියල්ලටම ඉහලින් සියල්ල සම්පූර්ණ ලෙස ඒකාබද්ධ කරන ප්‍රේමයෙන් සැරසිය යුතු බව.
- ★ කිතුනු ජීවිත ක්‍රිස්තුස්වහන්සේ හා බැඳුණු සංවේදී ජීවිත විය යුතු බව. (ල.5)

(iii) දේවරාජ්‍යයේ පුරවැසියන් සඳහා ආදර්ශ නායකත්වය

- ★ මෙය සේවක නායකත්වයකි
- ★ සාමාන්‍ය බල ධූරාවලිය උඩු යටිකුරු වීමකි
- ★ ප්‍රේමයේ ආධිපත්‍යය තුළ සාමකාමීව සහයෝගයෙන් කටයුතු කරයි
- ★ නායකයා යටත් අයට සේවය කරන අතර, යටත් අය සේවය ලබති
- ★ ශ්‍රේෂ්ඨ තැනැත්තා ඉතා සුළු තැනැත්තා ලෙස කටයුතු කරයි (ල.5)

(ලකුණු- 5x2=10)